**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,253,598,110 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව හා එය පිළියෙල කළ පසු මෙම අඩුපාඩු සියල්ල ඉවත් කිරීමට හැකියාව පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.426,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 103 ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.13,327,143 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව හා එය පිළියෙල කළ පසු මෙම අඩුපාඩු සියල්ල ඉවත් කිරීමට හැකියාව පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව, එදිනට පාරිතෝෂිත ප්‍රතිපාදනය රු.514,666,493 ක් වුවද, පාරිතෝෂිත ගණනය කිරීමේ කේවල ශේෂ ලැයිස්තුවට අනුව එය රු.601,158,480 ක් විය. 2019 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන දීමනාව හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හිලව් දීමනාව ඇතුළත්කර පාරිතෝෂිත ගණනයකර ගිණුම් තැබීමේදී සිදුව තිබුණු රු.86,491,987 ක ඌන වෙන්කිරීම 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදිකර නොතිබුණි. | මෙම වෙනස ගැලපීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ස්වයං උත්පාදක මූල්‍ය ක්‍රියාකාරම්වලින් ලැබී තිබුණු රු.73,414,154 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද, ඒ වෙනුවට ඉන් රු.36,425,658 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණු අතර ඉතිරි රු.36,988,496 ක් සෘජුවම සංවර්ධන අරමුදල් ගිණුම්වලට බැර කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.36,988,496 කින් අඩුවෙන් දැක්වේ. | ස්වයං උත්පාදක මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත අදායම ඉදිරියේදී ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළින් ගැලපීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | මූලධන හා සැලසුම් අංශය විසින් විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණු තොරතුරු අනුව, සමාජීය විද්‍යා හා භාෂා පීඨ දේශන ශාලා සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත 2021 දෙසැම්බර් 31 දින වන විට රු.20,860,844 ක් ගෙවිය යුතුව පැවතියද මූල්‍ය ප්‍රකාශන තුළ ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරන බව. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.47,851,166 ක් ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කර ණයහිමි ගිණුමට හර කර තිබුණු නමුත් ඊට අදාළ ජ'නල් සටහන පිළියෙල කර නොතිබුණු බැවින් එම ගනුදෙනුව හඳුනාගැනීමට හා පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙම ගොඩනැගිලි වටිනාකම ඉවත්කිරීම සඳහා ජ'නල් වවුචරයක් පිළියෙළ කර නොතිබුණු නමුත් ගිණුම්කරණ පද්ධතිය තුළ අනුමැතින්ට යටත්ව ගිණුම් තැබීම සිදුකර ඇති බව. | ගනුදෙනුව හඳුනාගැනීමට හා පරීක්ෂා කිරීමට අවශ්‍ය ජ'නල් වවුචර් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | කළමනාකරණ හා සමාජවිද්‍යා පීඨයේ ඉදිකිරීමක් වෙනුවෙන් 2019 වර්ෂයේදී ගෙවා තිබුණු රු.9,953,442 ක් නොනිමි වැඩ ගිණුමට හර කළ යුතුව තිබුණු නමුත් ඒ වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. ඒ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ගිණුම ඊට සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණු අතර 2019, 2020 හා 2021 යන වර්ෂ 03 සඳහා ගොඩනැගිලි ක්ෂය රු.1,493,016 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මුදල් අංශය විසින් රු.9,953,442 ක් ගෙවා අති බව හා ඒවන විට එම ඉදිකිරීම භාවිතා කළ බැවින් නොනිමි වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරු කළ බව. | නොනිමි වැඩ හා නිමි වැඩ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016 මාර්තු 01 දින නිකුත් කර තිබුණු අංක 4/2016 දරන චක්‍රලේඛයේ 5.5 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ ස්වයං උත්පාදක මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා පිළියෙල කර තිබුණු ව්‍යාපෘති ගිණුම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහනක් ලෙස හෙළිදරව් කර නොතිබුණි. තවද, යථෝක්ත චක්‍රලේඛයේ 5.5.2 ඡේදය ප්‍රකාරව වර්ෂය අවසානයේ අරමුදල් සඳහා දායකත්වය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හරහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වෙත මාරුකිරීම් සිදුකළ යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්වයං උත්පාදක මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා පිළියෙල කරන ලද ව්‍යාපෘති ගිණුම් ඉදිරියේදී විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | පීය ගොඩනැගිලි 03 ක් ඉදිකිරීම වෙනුවෙන් | 40,289,882 | - | 40,289,882 | මූලධන හා සැලසුම් අංශය සහ ඉංජිනේරුමය | බැරකම් නිවැරදිව හඳුනාගෙන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු මුදල | | | | කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයෙන් විමසා එම මුදල ගෙවීමට නොමැති නම් ඉදිරියේදී අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිරිකිරීමේ කර්මාන්තයේ නොනිමි වැඩ වටිනාකම | 48,882,099 | 75,503,800 | 26,621,701 | මූලධන හා සැලසුම් අංශය විසින් ඒ ඒ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුට කරන ලද ගෙවීම් පමණක් නොනිමි වැඩ වටිනාකම ලෙස හඳුනාගෙන ඇති බව හා ව්‍යාපෘතිය සඳහා දරන ලද සියලු වියදම් නොනිමි වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇති බව. | නොනිමි වැඩ වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පෞද්ගලික සමාගමක් වෙත ගෙවිය යුතු උපචිත වියදම් | 1,647,000 | - | 1,647,000 | මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂාකර ඉදිරියේදී නිවැරදි කරන බව. | වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ක්‍රීඩාපිටිය හා භූ විඥාපන පීඨය ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු ශේෂය | 14,700,327 | 11,569,096 | 3,131,231 | මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂාකර ඉදිරියේදී නිවැරදි කරන බව. | වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | පිරිමි නේවාසිකාගාරය ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු ශේෂය | 7,486,262 | 10,807,708 | 3,321,446 | -එම- | -එම- |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විවිධ තැන්පතු | 1,168,125 | විස්තරාත්මක උපලේඛන | විවිධ තැන්පතුවලට අදාළව 2021 වර්ෂයේ සිට ගිණුම් අංශය විසින් උපලේඛනයක් පවත්වාගෙන යන බව. | විවිධ තැන්පතු ගිණුමේ පවතින ශේෂ හඳුනාගැනීමට හැකි පරිදි උපලේඛන විධිමත්ව පවත්වා ගෙන යා යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 04 සිට වර්ෂ 21 දක්වා වූ කාලපරිච්ඡේදයක සිට පැවත එන සේවකයින් 07 දෙනෙකුගේ රු.439,429 ක් වූ ආපදා ණය, පරිගණක ණය, වාහන ණය, සේවක ණය හා උත්සව අත්තිකාරම් ණය ශේෂ 12 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල ගිවිසුම් කඩකිරීම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල කටයුතු සිදුවෙමින් පැවතීම නිසා අය කර ගත නොහැකිව ඇති බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට මහපොළ භාරකාර අරමුදල වෙත ගෙවිය යුතුව පවතින රු.2,201,150 ක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි. | මහපොළ භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.2,201,150 ක් ඉදිරියේදී නිරවුල් කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල් ආයෝජනය කළ හැකි වුවද, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.116,660,274 ක් ස්ථාවර තැන්පතු 08 ක ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාලය සතු අතිරික්ත අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර නොමැති බව හා විශ්වවිද්‍යාලයීය මුදල් කමිටුව හා පාලක සභා අනුමැතිය සහිතව ස්ථාවර තැන්පතුවල තාවකාලික පදනම මත මුදල් ආයෝජනය කර ඇති බව. | මුදල් පනත හා චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(5) | නිකුත් කරන තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද, 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 32 කදී නිලධාරීන් 23 ක් හා ආයතන 06 ක් වෙත නිකුත් කර තිබුණු ව්‍යාපෘති, පුනරාවර්තන, මූලධන සහ පර්යේෂණ අත්තිකාරම් රු.6,743,084 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි. | මෙම වර්ෂයේ සිට නොපියවූ අත්තිකාරම්, ලබාගන්නා පුද්ගලයාගේ වේතනයෙන් අයකර ගැනීමේ සහතිකයක් අත්තිකාරම් ඉල්ලීමේ අයදුම් පත්‍රය සමඟ ලබා ගන්නා බව හා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.16,686,382 ක් වූ රැඳවුම් මුදල් අදාළ පාර්ශව විමසා රජයේ ආදායමට බැර කර නොතිබුණි. | මෙම රැඳවුම් මුදල් අදාළ පාර්ශවයන් වෙත ගෙවීමට විශ්වවිද්‍යාලය බැඳී සිටින බැවින් නියාදනය කළ නොහැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී | නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතුව තිබෙන රු.28,079,397 ක් අයකර | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ |

| | | | |
|---|---|---|---|
| සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය | අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවී තිබුණු නිලධාරීන් 11 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු.50,516,467 ක් 2022 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට අදාළ ලිපි ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.72,767,750 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.100,763,338 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.173,531,088 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.216,393,885 කින් වැඩිවී තිබුණු නමුත් පුනරාවර්තන ප්‍රදාන රු.297,500,000 කින් හා වෙනත් ආදායම් රු.28,697,543 කින් වැඩිවී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම වෙනුවෙන් රු.400,000 ක්ද, එම මෘදුකාංගයට දත්ත ඇතුළත් කර වත්කම් ලේඛනය සැකසීම සඳහා රු.968,300 ක්ද වශයෙන් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.1,370,300 ක් අවස්ථා 08 කදී ගෙවා තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.6,614,202,769 ක් වූ දේපළ පිරියත හා උපකරණ ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනය 2022 මැයි 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි ඇතුළු සියලුම ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර අගය කිරීම් කර පරිගණක ගත කර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව. | ස්ථාවර වත්කම් ලේඛනය සැකසීමේ කටයුතු කඩිනකමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේදී රු.123,052,693 ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2017 අගෝස්තු 09 දින නියෝග කර තිබුණු නමුත් රු.5,156,160 ක් වූ රඳවා ගැනීමේ මුදල් | ක්‍රීඩා පිටිය ඉදිකරන ලද ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය සමඟ සාකච්ඡා කළ බව, ඔවුන් නිසි පරිදි හා සතුටුදායක ලෙස වැඩ අවසන් කර 2012 අප්‍රේල් 30 දින ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇති බව හා | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| භාවිතා කර ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට 2022 මැයි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2013 අප්‍රේල් 30 දිනෙන් නඩත්තු කාල සීමාවද අවසන් බව දන්වා ඇති බව, එමෙන්ම ඔවුන්ගේ රැඳවුම් මුදල් සහ අවසාන බිල්පත් ගෙවීම් භාවිතා කර තුන්වන පාර්ශවයක් හරහා කටයුතු කිරීම යුක්ති නොවන බැවින් එම අවසාන බිල්පත් හා රැඳවුම් මුදල් ඔවුන් වෙත ගෙවන ලෙස හා එසේ නොමැති නම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවන බව දන්වා ඇති බව. | |
| (ඇ) ස්වීඩනයේ ගෝදන්බර්ග් (University of Gothenburg) විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුමකට අනුව 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු රු.5,434,801 කින් රු.1,676,970 ක් වසර 03 ක පමණ කාලයක් ඌන උපයෝජිතව පැවතුණි. | මේ වන විට අදාළ මුදල උපයෝජනය කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සම්බන්ධීකාරක විසින් මුදල් අංශය වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව හා ඒ අනුව මුදල් කමිටුවේ නිර්දේශය සහ පාලක සභාවේ අනුමැතියට යටත්ව ඉදිරියේදී කටයුතු කරන බව. | ලැබී ඇති මුදල් ඵලදායී ලෙස හා විධිමත් ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) 2016 ජුනි මාසයේදී රු.15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Desktop පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතරවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා 2018 පෙබරවාරි මාසයේදී ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. 2018 මැයි 19 දිනැති පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත ලෙස කටයුතු කර තිබුණු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු බව නිර්දේශ කර තිබුණු නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණු අතර 2018 ජුනි 21 දින රු.1,596,400 ක් වූ රැඳවුම් මුදල්ද කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. | කමිටු තීරණය මත රැඳවුම් මුදල් නිදහස් කළ බව, 2022 ජනවාරි 24 දින පැවති 280 වෙනි පාලක සභා තීරණය අනුව අදාල අනෙකුත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව, ඒ අනුව පරිපාලන හා මූල්‍ය රෙගුලාසි පිළිබඳව පරිපාලන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුවක් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇති බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත ලෙස කටයුතු කර තිබුණු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විදේශගත වූ නිලධාරීන් 05 දෙනෙකු අධ්‍යයන කටයුතු අවසන් නොකර නැවත සේවයට වාර්තාකර | මෙම නිලධාරීන් පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ නොකළහොත් පාලක සභාවේ උපදෙස් මත ගිවිසුම් ගත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බව. | ගිවිසුම් ගත කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අතර, 2022 පෙබරවාරි මාසය වන විටත් පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණි. එම නිලධාරීන් අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවීමේදී විශ්වවිද්‍යාලය සමඟ එළඹ තිබුණු ගිවිසුමේ 19 වන වගන්තිය ප්‍රකාරව, අධ්‍යයන කටයුතු අතහැර දැමීම හෝ නියමිත කාලය තුළ සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අධ්‍යයන කටයුතු සඳහා දරන ලද සියලුම වියදම් අයකළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.42,853,450 ක බැඳුම්කර වටිනාකම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | | |
| (ආ) | විශ්වවිද්‍යාලයේ අනධ්‍යන කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන් 13 දෙනෙකු වෙත 2020 ජනවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ දීමනා වශයෙන් එකතුව රු.6,081,025 ක් ගෙවා තිබුණු නමුත් දීමනා ලබාගත් කිසිදු නිලධාරියෙකු පර්යේෂණ කාල සීමාව අවසානයේ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. පෙර පර්යේෂණයේ ප්‍රගතිය නොසලකා නව පර්යේෂණ යෝජනාවක් සඳහා ඉදිරි වර්ෂයට දීමනා අනුමත කිරීමට පර්යේෂණ කමිටුව කටයුතු කර තිබුණි. | 2020 සහ 2021 වර්ෂයන් සඳහා ලබාදුන් පර්යේෂණ දීමනාවන්ට අදාළව පර්යේෂණ යෝජනාවල අවසන් පර්යේෂණ වාර්තා 06 ක් මේ වන විට ඉදිරිපත් කර ඇති බව. | පර්යේෂණ දීමනා ලබාගන්නා සියළු නිලධාරීන් ගෙන් පර්යේෂණ වාර්තා ලබා ගත යුතුය. |
| (ඇ) | මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා 2014 මාර්තු 15 දින සිට 2017 මාර්තු 14 දින දක්වා මාස 36 ක විදේශ අධ්‍යයන නිවාඩු ලබා තිබුණු නිලධාරියකුගේ ඉල්ලීම මත 2015 නොවැම්බර් 19 දින සිට වසර 03 ක් ලංකා විදුලිබල පුද්ගලික සමාගමේ සභාපති තනතුරේ සේවය කිරීම සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර තිබුණි. නියමිත කාලය තුළ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර නොතිබුණු නමුත් විශ්වවිද්‍යාලය විසින් රු.10,313,221 ක බැඳුම්කර වටිනාකම අයකර නොතිබුණි. ඒ වෙනුවට විශ්වවිද්‍යාලීය පශ්චාත් උපාධි පීඨයේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා එම නිලධාරියා වෙත 2019 පෙබරවාරි 20 දින සිට 2020 ජුනි 13 දින දක්වා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර, පූර්ව බැඳුම්කර වටිනාකමද ඇතුළත් කර නව පශ්චාත් උපාධි පාඨමාලා බැඳුම්කරයකට ඇතුළත් වීමටද අවස්ථාව සලසා තිබුණි. නමුත් 2022 මැයි 30 වන විටත් එම ආචාර්ය උපාධිය හෝ සම්පූර්ණ කර නොතිබුණි. | දර්ශණ විශාරද උපාධි සහතිකය ඉදිරිපත් කිරීමට දැනුම් දෙන බව හා පාඨමාලාව සම්පූර්ණ නොකළහොත් පාලක සභාවේ උපදෙස් මත ගිවිසුම් ගත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බව. | ගිවිසුම් ගත කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය තුළදී රු.21,000,000 ක් වැයකර නිවාස සංකීර්ණය තුළ වැසි ජලය එක්රැස් කර පිරිපහදු කිරීමේ පද්ධතියක්, වාහන සේදුම් අංගනයක් හා කසළ ගබඩා කිරීම සඳහා කුඩා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු නමුත් ඒවා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර රු.15,000,000 ක් වැයකර ඉදිකර තිබුණු කුඩා වෙළඳ සංකීර්ණය අරමුණුගත කාර්යය සඳහා යෙදවීමකින් තොරව වසර 02 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | සියළුම නිවාස හිමියන් පදිංචි කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය තුළ ඇති පහසුකම් භාවිත කිරීම සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කර මෙම පහසුකම් සාමාන්‍ය පරිදි භාවිතා කිරීමට පියවර ගනු ලබන බව හා ජලය හා විදුලිය අදාළ ආයතන වලින් ලබා දීමට ප්‍රමාදවීම, කොවිඩ් වසංගතය හේතුවෙන් රටේ ආර්ථික කටයුතු අකර්මන්‍යවී තිබීම ආදී ගැටලු හේතුවෙන් කුඩා වෙළඳ සංකීර්ණය පසුගිය කාල සීමාව තුළ බදු දීමට නොහැකි වූ බව. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරී සීමාව ඉක්මවා තිබීම හේතුවෙන්, ප්‍රසම්පාදනය කොටස් හතරකට වෙන්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය මත රු.34,123,169 ක් වැය කර වෛද්‍ය පීඨයට විද්‍යාගාර උපකරණ මිලදී ගෙන තිබුණි. තවද, Desktop පරිගණක 172 ක් කොටස් 5 කට හා Laptop පරිගණක 76 ක් කොටස් 3 කට වෙන්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය මත රු.44,983,730 ක් වැයකර එම පරිගණක මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගහැර කටයුතු කිරීමක් හෝ අධිකාරි මට්ටම නොසලකා හැර කටයුතු කිරීමක් සිදු නොකළ බව, රටේ පැවති තත්ත්වය මත පිරිවිතර සම්පූර්ණ වන පිළිවෙලට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ක්‍රියාත්මක කළ බව, භාණ්ඩවල මිල ඉතා කෙටි කාලයකින් සීඝ්‍රයෙන් ඉහළ යාම, භාණ්ඩ හිඟවීම, කොවිඩ් වසංගත තත්ත්වය මත වෙළඳපල තුළ ඇති වූ අවිනිශ්චිතතාවය ආදී කරුණු ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගැනීමේදී විශේෂයෙන් සැලකිල්ලට ගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, නිර්මාණය කිරීමේ සහ ඉදිකිරීමේ (Design & Built) පදනම මත එකතු කළ අගය මත බදු රහිත රු.355,715,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2017 ඔක්තෝබර් 30 දින ඉදිකිරීම් සමාගමක් වෙත පවරා තිබුණි. ලංසු ලේඛනවල අභ්‍යන්තර මාර්ග පද්ධතිය හා ආරක්ෂිත වැට පිළිබඳ අවශ්‍යතාව අධි ඇස්තමේන්තු කර තිබීම හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම අයිතම පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර නොතිබීම, ප්‍රසම්පාදනය පිරිනමා | භූමිය වටා ඉදිකර තිබුණු වැටෙහි දිග ප්‍රමාණය අනුව වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් ගණනය කර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගන්නා බව, ලංසු ලේඛනයෙහි මිල ඉදිරිපත් කිරීම් යෝජනාවල අභ්‍යන්තර මාර්ග පද්ධතිය සැකසීමට හා ඊට අදාළ අනෙකුත් කරුණු සඳහා රු.23,500,000 ක මිල ඉදිරිපත් කිරීමක් කර ඇති බව හා මුදල් ගෙවීමේදී මාර්ගවල දුර ප්‍රමාණය ගණනය කිරීමක් අවශ්‍ය නොවන බැවින් මුළු මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා | සිදුව ඇති මූල්‍යමය අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු පිරිවැය පිළිබඳ නොසලකා සැලසුම් සංශෝධනය කර තිබීම ආදී කරුණු හේතුවෙන් විශ්වවිද්‍යාලයට දළ වශයෙන් රු.20,116,000 ක අලාභයක් සිදුව තිබුණි. | ඇති බව. | |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියර, එකතු කළ අගය මත බදු රහිත රු.315,051,433 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව මාස 24 ක් තුළ වැඩ අවසන් කිරීමේ කොන්දේසිය මත 2018 ජනවාරි 30 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.63,010,286 ක් ගෙවා තිබුණු අතර අත්තිකාරම් ඇපකරය 2020 පෙබරවාරි 07 දින කල් ඉකුත්වී තිබුණි. නමුත් එහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අතරතුර කොන්ත්‍රාත්කරු ඉදිකිරීම අතහැර දමා තිබුණු අතර වැඩ ඉංජිනේරු විසින් අවසන්වරට සහතික කර තිබුණු කළ වැඩ වටිනාකම රු.43,058,226 ක් විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා කළ වැඩ වටිනාකම වශයෙන් රු.83,010,286 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු බැවින් කොන්ත්‍රාත්කරුගෙන් ආපසු අයකළ යුතු මුදල රු.39,952,060 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී රු.15,752,572 ක කාර්යසාධන බැදුම්කරය මුදල් කර විශ්වවිද්‍යාලයේ පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත හා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව 2021 පෙබරවාරි 01 දින උප කොන්ත්‍රාත්කරුවකු සමඟ ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ගිවිසුම අනුව 2022 පෙබරවාරි 24 දිනට පෙර වැඩ අවසන් කළ යුතු විය. නව ගිවිසුම අත්සන් කර තිබුණු දිනයේ සිට දින 07 ක් ඇතුළත උප කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු රු.53,442,615 ක අත්තිකාරම් බැදුම්කරය ඉදිරිපත් කිරීම පැහැර හැර තිබියදී හා රු.15,752,572 ක කාර්යය සාධන බැදුම්කරය ඉදිරිපත් කිරීම 2022 මාර්තු 24 දින දක්වා ප්‍රමාද කර තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු නොකර කොන්ත්‍රාත් කාලය 2023 ජනවාරි 23 දින දක්වා දීර්ඝ කිරීමට නිර්දේශ කර තිබුණි. | උපකොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් 2021 ජූලි 31 දින රු.23,750,499 ක් වටිනා බිල්පතක් ඉදිරිපත් කළ බව, අදාළ ආයතනය විසින් කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කරන තෙක් එම බිල්පත සඳහා ගෙවීම් නොකිරීමට පාලක සභාව තීරණය කර ඇති බව, එසේම ඉදිරියේදී ඉදිරිපත් කරන බිල් පත්‍රවලින් සියයට 50 ක වටිනාකමක් කපා ගනිමින් අත්තිකාරම් ඇපකරය (Mobilization Advance) සම්පූර්ණ කර ගන්නා බව උපකොන්ත්‍රාත්කරුට දන්වා ඇති බව හා කාර්යසාධන ඇපකරය ඉහත දිනය වන විට ලබා නොදුනහොත් අදාළ පාර්ශවයන් සමඟ නීතිමය කටයුතු කිරීමට පාලක සභාව තීරණය කර ඇති බව. | පවතින ගැටළු විසඳාගනිමින් ගොඩනැගිල්ල නිම කිරීමට කටයුතු කළ යුතු අතර අත්තිකාරම් ඇපකරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර නොගැනීමට වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 මැයි 15 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 461 කින් තනතුරු 113 ක් හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 541 කින් තනතුරු 149 ක් පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.17,947,941 ක් ගෙවීමට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැවති පුරප්පාඩුද හේතුවී තිබුණි. | 2022 ජනවාරි සිට 2022 මැයි 19 දින දක්වා කාර්යය මණ්ඩල බඳවා ගැනීම් 06 ක් සිදු කර ඇති බව, අනෙකුත් බඳවා ගැනීම් සඳහා ලැබී ඇති අයදුම්පත් සඳහා සම්මුඛ පරීක්‍ෂණ ඉදිරියේදී පැවැත්වීමට බලාපොරොත්තු වන බව,<br>අංක 21/1596/304/134 දරන 2021 අගෝස්තු 31 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දැනට සියලුම බඳවා ගැනීම් තාවකාලිකව නතර කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින් මේ වන විට සියලුම බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇති බව. | පවතින නීති රීතිවලට අනුකූලව පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |